## සත්ත්ව ලෝකය




# රතු ලැයිස්තුවේ ඉහළින්ම ඉන්න වලසා

තිලිනී රත්නායක

කුඩා කාලයේ දී අපි වලස් පැටවුන් ගැන රසවත් කතා අසා ඇත්තෙමු. වලසුන් බොහෝ සේ ප්‍රිය කරන මී වද කැමට ගොසින් සිදු වූ අකරතැබ්බයත් පත පොතින් රූපවාහිනියේ කාටූන් වැඩසටහන් වලින් නරඹා ඇත්තෙමු. සත්තුවත්තේ දී ජීවමාන වලසුන් සියැසින් දැක ගැනීමට ද අපට භාග්‍යය උදා වී තිබේ. එසේ වුවත් ලෝකයේ වෙසෙන වලස් විශේෂ අට අතුරින් අප දැක ඇත්තේ එක් අතක ඇඟිලි ගණනටත් වඩා අඩු වලසුන් ගණනකි. එයට එක් ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ සමහර වලසුන් හට ජීවත්විය හැකි පරිසර ස්වභාවයන් හා ඔවුන්ගේ ජීවන රටාවන් යම් රටකට හෝ ප්‍රදේශයකට පමණක් සීමා වී තිබීමයි. උදාහරණයක් ලෙස "කෝලා වලසුන්" ජීවත් වන්නේ ඕස්ට්‍රේලියාවේ පමණි. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ඔවුන්ගේ ආහාර පුරුද්දයි. මොවුන් ඕස්ට්‍රේලියාවේ ප්‍රදේශයක වැවෙන ගම් (Gum)නමැති ශාක විශේෂයක පත්‍ර පමණක් ආහාරයට ගන්නා නිසා එම ආහාර ප්‍රභවයෙන් ඈත් කර තිබීම මරණය ගෙන දීමට හේතුවක් වී තිබේ. එම ප්‍රදේශය කෝලා වලසුන් වෙනුවෙන් ම වෙන්කර ඔවුන්ට ආරක්ෂාව ලබා දීමටත් නරඹන්නන්ට එම ප්‍රදේශයට ගොසින් ඔවුන් නැරඹීමට අවස්ථාව උදා කර දීමටත් ඕස්ට්‍රේලියානු පරිසර වේදීන් කටයුතු යොදා ඇත. ජපානය නිජ භූමිය කොටගත් "පැන්ඩා වලසුන්ගේ" තත්ත්වය ද ඊට නොදෙවැනි යි.

මෙවන් අවදානමක සිටින වලසුන් අද ලෝකයෙන් තුරන් ව යන වන සතුන් ඇතුළත් "රතු ලැයිස්තුවේ" ඉදිරියෙන් ම සිටින සත්ත්ව කොටසක් වන්නේ වලස් විශේෂයනුයි. ඒ අතුරින් කුඩාම වලසා ලෙස ගැනෙන මධු වලසා (Honey Bear)හෙවත් මාලේ වලසා(Malay Bear)යන අන්වර්ථ නාමයන්ගෙන් හඳුන්වන "හිරු වලසා" (Sun Bear)ප්‍රධානයි. මැලේසියාව, ඉන්දුනීසියාව සහ ඉන්දියාවේ ඈත බටහිර ප්‍රදේශවල ජීවත් වන මොවුන්ගේ ජීවන රටාවන් පිළිබඳව සවිස්තර අධ්‍යයනයක් කර ගැනීමටත් පෙර ම ලෝකයෙන් තුරන් ව යාදෝයි යන බියක් සහ විමතියක්, වන සත්ත්ව වේදීනට හා වන ජීවී පර්යේෂකයන්ට ඇති වී තිබෙනවා.

මෙනිසාම විවිධ වලස් විශේෂයන් පිළිබඳව තොරතුරු ගවේෂණය කර ගැනීමටත් ඒවා ලෝක ප්‍රජාව හමුවේ තැබීමට හා වන ජීවීන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියා මාර්ගයන් ගැනීමටත් පරිසර වේදීන්ගේ අවධානය බෙහෙවින් යොමුවෙමින් තිබේ.

ඒ අනුව උතුරු අර්ධගෝලයේ "හිම වලසා"(Nanook)හෙවත් "ධ්‍රැව වලසා" (Polar Bear)පිළිබඳව අපූර්ව වූ තොරතුරු රාශියක් අනාවරණය කර ගැනීමට පර්යේෂකයන් සමත් වී ඇත.

### හිම වලසාගේ පරම්පරාව

පරිසර ගවේෂකයන් විශ්වාස කරන අන්දමට හිම වලසා ඍජුවම වලස් විශේෂයන් අතුරින් තවත් එක් වලස් විශේෂයක් වන විශාල දුඹුරු වලසුන්ගෙන් පැවතගෙන එන්නෙකි. දුඹුරු වලසුන්ගේ ඇතැම් ගති ස්වභාවයන් හිම වලසා තුළ මේ වන විටත් විනාශ නොවී තිබීමෙන් එය සනාථ වන බව ඔවුන්ගේ අදහසයි.

අයිස් යුගයේ දී එනම්, දළ වශයෙන් වසර 100 000 සිට 250 000 අතර කාලයකට පෙර හිම අවකාශය මත හුදෙකලා භාවයට පත් වූ දුඹුරු වලසුන් පරිසර තත්ත්වයන්ට හුරුවෙමින් ඊට අනුවර්තනය වී තිබේ. වර්තමානයේ උතුරු අර්ධගෝලයේ පවතින දැඩි ශීතල සහිත කර්කශ පරිසරය හිම වලසාගේ වාස භූමිය බවට පත්ව තිබේ.

උත්තරාර්ධ ගෝලයේ ධ්‍රැවය අවට ප්‍රදේශයන් රැසක හිම වලස්සු ජීවත් වෙති. එම ප්‍රදේශ අතුරින් රුසියාව, නෝර්වේ, ග්‍රීන්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය හා කැනඩාව යන රටවල් ආශ්‍රිත ප්‍රදේශ විශේෂ ය.

හිම වලසුන් වඩාත් ප්‍රිය කරනු ලබන, ඔවුන්ගේ ජීවන රටාවන් සියල්ලකට ම පාහේ තෝතැන්නක් වී තිබෙනුයේ උතුරු ප්‍රදේශයේ සාගර මුණගැසෙන වෙරළ තීරයන් ය. මෙම ප්‍රදේශ ආශ්‍රිතව පවතින දේශගුණ රටාව එනම්, අඛණ්ඩ හිම පතනය හා හිම දිය වී යන ස්වභාවයන් හිම වලසුන්ට සිත් සේ පීනා යමින් ජල කෙළියේ යෙදීම

**ලෝකයේ වෙසෙන වලස් විශේෂ අට අතුරින් අප දැක ඇත්තේ එක් අතක ඇඟිලි ගණනටත් වඩා අඩු වලසුන් ගණනකි. එයට එක් ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ සමහර වලසුන් හට ජීවත්විය හැකි පරිසර ස්වභාවයන් හා ඔවුන්ගේ ජීවන රටාවන් යම් රටකට හෝ ප්‍රදේශයකට පමණක් සීමා වී තිබීමයි.**

සඳහා 'Leads' නමින් හඳුන්වන නිරාවරණය වූ කුඩා දිය තටාක වලින් මෙම ප්‍රදේශ යුක්ත වීමත් වෙරළ තීරයන්වල රැඳීමට හිමවලසුන්ට පිටුබලයක් වී තිබේ. මේ සියල්ලටත් වඩා ඔවුන් බොහෝ සේ ප්‍රිය කරන ආහාරය වන සීල් මත්ස්‍යයන්ගේ ගහණය අධික වීම මෙම ප්‍රදේශයන්ට ඇලුම් කිරීමට ප්‍රධාන හේතුවක් වෙයි.

මධ්‍යම සයිබීරියාව, ග්‍රීන්ලන්තය, කැනේඩියානු දූපත් සමූහය, හඩ්සන් හා ජේම්ස් මුහුදු බොකු ආශ්‍රිත ප්‍රදේශ ආදී ස්ථානවල ප්‍රත්‍යක්ෂ ලෙසම හිම වලස් ගහණයන් ඇති බව අනාවරණය කරගෙන තිබේ. මෙහි වැඩුණු හිම වලසුන් විවිධ හිම පතන රටාවන්ගේ ප්‍රතිඵලයන් වශයෙන් විවිධ ජීවන රටාවන්ට පුරුදුවලට අනුව ඇති දැඩි වී තිබේ.

ගණන් බලා ඇති පරිදි දැනට ලෝකයේ ආසන්න වශයෙන් 20,000 ත් 40,000 ත් අතර හිමවලසුන් ප්‍රමාණයක් ඇත. මෙයින් විශාලම ගහණය අයත් වන්නේ කැනඩාවටයි. එය ආසන්න වශයෙන් 15, 000 ක පමණ සංඛ්‍යාවකි. කැනේඩියානු දූපත් සමූහයත් හඩ්සන් සහ ජේම්ස් මුහුදු බොකු ආශ්‍රිතවත් හිමවලසුන් ව්‍යාප්තව සිටියි.

උතුරු වාසී මිනිසුන්ගේ දඩයම් කිරීම්වලට ලක් වීම නිසා වසර කීපයක සිට ම හිම වලසුන් ප්‍රමාණය ශීඝ්‍රයෙන් පහත වැටෙමින් තිබුණි. මේ තත්ත්වය වලක්වා ඔවුන් රැක ගැනීම පිණිස 1967 දී නෝර්වේ, කැනඩාව, රුසියාව, ග්‍රීන්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය යන ප්‍රධාන රටවල් පහ එක්වී හිම වලසුන් ආරක්ෂා කර




ගැනීම සඳහා ආරක්ෂක ගිවිසුමක් ස්ථිර කර ගනු ලැබී ය. මෙම ගිවිසුම නිසා අද වන විට ලෝකයේ සිටින හිම වලස් ගහණය පහත වැටීමට ඉඩ නොදී එක්තරා ස්ථාවර මට්ටමක තබා ගැනීමට හැකි වී තිබේ.

## ජීවන තොරතුරු

හිම වලසා විශාල ක්ෂීරපායි සත්ත්වයෙකි. මොවුන්ගේ ළඟම ඥාතීන් වන දුඹුරු වලසා සේම වලස් පවුලේ දැවැන්තයින් ලෙස හිම වලසා හඳුනාගත හැකියි. සත්සත්දනාත්මකව බලන විට තනි තනි හිම වලසුන් අතර ප්‍රමාණය සම්බන්ධයෙන් විවිධතා පවතියි. සාමාන්‍යයෙන් වැඩුණු හිම වලසෙක් පාද හතර බිම ඔබා සිට විට උස ආසන්න වශයෙන් මීටරයක් එනම් අඩි තුනහමාරක් පමණ වේ. සිරුරේ දිග නාසයේ සිට වලිගය දක්වා අඩි අටයි කාලේ සිට අඩි එකොළහමාරක් අතර එනම් සෙන්ටිමීටර් 250 සිට 350 අතර ප්‍රමාණයක් වෙයි.

හිම වලසුන්ගේ ශරීරය ඉතා විශාලව වර්ධනය වෙයි. හිමවලස් දෙනක් සාමාන්‍යයෙන් රාත්තල් 660 (කි. ග්‍රෑ. 300) පමණ බරකින් යුක්තයි. පොදුවේ ගත් කල පිරිමි වලසුන් ඊට වඩා වැඩි බරකින් යුක්තයි. එය කිලෝග්‍රෑම් 500 සිට 600 දක්වා එනම් රාත්තල් 1100 සිට 1350 දක්වා ප්‍රමාණයක් වෙයි. එක්තරා අවස්ථාවකදී බර රාත්තල් 22100 ක් දක්වා වැඩුණු වැඩිහිටි හිම වලසෙක් පිළිබඳව වාර්තා විය.

හිම වලසකුගේ ආයු කාලය වසර 25 ක් හෝ ඊට වැඩි කාලයක් වෙයි.

## සිරුරේ ස්වභාවය

බරැති සිරුරකට හිමිකම් කියන හිම වලසාගේ පාදයන් එම බර උසුලා සිටිය හැකි වන අන්දමේ ශක්තිමත් පේශීන්ගෙන් සමන්විත වෙයි. අනෙක් වලස් විශේෂයන් සමඟ සසඳ බැලීමේ දී ඔවුනට වඩා ප්‍රමාණයෙන් කුඩා හිසක් සහ මනාව වැඩුණු ගෙළක් හිම වලසාට ඇත. ලොම් වලින් වැසුණු කුඩා කන් දෙකත් කෙටි වලිගයත් හිමවලසාට සුන්දරත්වයක් එක් කරයි. දුඹුරු වලසාට වඩා දික් වූ ගෙලක් තිබීම නිසා දියේ පීනා යාමේ දී හිස මතු පිටට එන සේ වඩාත් පහසුවෙන් තබා ගැනීමට හිම වලසා සමත් වෙයි.

**හිමවලසාට හොඳින් වැඩුණු උදරයක් තිබෙන අතර එහි රාත්තල් 150 ක (කිලෝ ග්‍රෑම් 70 ක) පමණ ආහාර ප්‍රමාණයක් රඳවා තබා ගැනීමට හැකියි.**

හිම වලසාගේ ඉදිරි පාදයන් පසු පාදයනට වඩා ප්‍රමාණයෙන් විශාලයි. එහි එක් යටි පතුලක විශ්කම්භය සෙන්ටිමීටර් 30 ක් පමණ වෙයි. පාදවල තිබෙන ඇඟිලි අතර ඇති සියුම් සිවිය නිසා ඉදිරි පාද යුගල හබලක් සේ භාවිතා කරමින් වතුර තල්ලු කරගෙන වේගයෙන් ඉදිරියට යාමේ හැකියාව හිමවලසාට ලබා දෙයි. පසු පාදවල යටි පතුල් තරමක් කුඩා වන අතර ඉදිරි හා පසු පාදවල පතුල් ඝන ලෝමයෙන් වැසී තිබේ. එනිසාම හිම මතු පිට හොඳින් එහා මෙහා යාමේ පහසුව හිම වලසුන්ට ලැබේ. විලුඹ හා පා ඇඟිලි බිම පතිත කරමින් මිනිසුන් පියවර තබන විලාසයට සමාන ක්‍රමයකට හිම වලසා ද හිම මත ඇවිද යයි.

හිම මතදී මෙන් නොව ගොඩබිමේ දී දුඹුරු වලසුන් තරම් වේගවත් නොවන හිම වලස්සු උන්ගේ ඉදිරි පාදවල තිබෙන මුළු ශක්තියම සීල් මත්ස්‍යයන් වාසය කරන බිල් කඩා දැමීමටත් වතුරේ සිටින විශාල සීල් මත්ස්‍යයන්ට සෙමෙන් පහර දෙමින් උඩ විසි කිරීමටත් ඉතා ශූර ලෙස භාවිත කරති. කෙටි දුරක් දිවීම සඳහා පැයට කිලෝමීටර් හතළිහක (පැයට සැතපුම් 25 ක) වේගයක් රඳවා ගැනීමේ හැකියාව ද හිමවලසකුට ඇත.

හිමවලසාට හොඳින් වැඩුණු උදරයක් තිබෙන අතර එහි රාත්තල් 150 ක (කිලෝ ග්‍රෑම් 70 ක) පමණ ආහාර ප්‍රමාණයක් රඳවා තබා ගැනීමට හැකියි. මොවුන්ගේ ජීර්ණ ක්‍රියාවලිය පැළැටි ආහාරයට ගන්නා එනම් ශාක භක්ෂක සතුන්ගේ මෙන් නොව මුළුමනින් ම වාගේ මාංශ භක්ෂණයෙන් යැපෙන සතුන්ගේ ස්වභාවයම ගනියි.

හිමවලසාගේ මාංශ භක්ෂක ස්වරූපය රැක දෙන තවත් සාධකයක් වන්නේ දත්වල පිහිටීමයි. මොවුන්ගේ හක්කේ ඇති දත්වල

මතුපිට පෘෂ්ඨය සමතලා වීම වෙනුවට තියුණු තුඩවල් බඳු කොන් සහිත ස්වභාවයකින් මතු පිට පෘෂ්ඨය සෑදී තිබේ. පොදුවේ සෑම හිමවලසෙක් ම මෙම දත් මස් ඉරා කෑම සඳහා භාවිතයට ගනියි. බල්ලන්ගේ වැනි වූ උල් රදනක දත් ගොදුරු දැඩි ලෙස ග්‍රහණය කර තබා ගැනීමට උපකාරී වේ. එම දත් දිගුයි. එසේම තියුණුයි. දත් අතර ඇති පරතරය වැඩියි. හිමවලසාගේ ළඟම ඥාතියා වන දුඹුරු වලසාට වඩා දත් වෙන වෙනම ඈතින් ඈතින් පිහිටා තිබේ.

මුළුමනින් ම වාගේ හිමවලසකුගේ සිරුර ලෝමයෙන් වැසී තිබේ. තනි සුදු පැහැයේ සිට දුඹුරු වර්ණයට සමීප වන ආකාරයේ දුර්වර්ණ ස්වභාවයක් දක්වා ලෝමවල පැහැය වෙනස් වෙයි. සිරුරේ ලෝම ආවරණය තට්ටු දෙකකින් සමන්විතයි. උදරයට ආසන්නව තිබෙන යටි ආවරණය කිරි සුදු ලෙස අප හඳුන්වන දීප්තිමත් සුදු වර්ණයෙන් යුක්තයි. මතු පිට ආවරණය ඊට මඳක් අවපැහැ ස්වභාවයක් දරයි. එය සිරුරට රැකවරණය සලසා දෙන දිගු ලෝම වලින් සමන්විත වේ. මේවා අතර තනි තනි කැරළි වශයෙන් තැනින් තැන තිබෙන ආරක්ෂක ලොම් යටට ගුලි වී තිබේ. හිමවලසා දියේ පීනා යාමේ දී දිය මතු පිට පාවෙන ස්වභාවය වර්ධනය කර ගැනීමට ඒවා වඩාත් ප්‍රයෝජනවත් වේ.

සත්‍ය වශයෙන් නම් හිමවලසාගේ පැහැය විය යුත්තේ කළු වර්ණයයි. ජීවත් වන පරිසරයට අනුගත වෙමින් සිරුරේ උෂ්ණත්වය රඳවා තබා ගැනීමේ අවශ්‍යතාවත් මත ලෝම සුදු වර්ණයට අනුවර්තනය වී ඇති බව සිතා ගැනීම එතරම් අපහසුවට කරුණක් නොවේ.

## පිහිනීමේ හැකියාව

"උර්සස් මැරිටිමුස්" "Ursus maritimus"හිම වලසා හැඳින්වෙන විද්‍යාත්මක නාමය යි. එහි අර්ථය "මුහුදු වලසා" යන්නයි. වචනයෙන් දක්වෙන පරිද්දෙන් ම හිමවලසුන් සාගර ජීවිතයට ඉතා හොඳින් හැඩගැසුණු සත්ත්ව කොටසක් බව වැටහෙයි. මොවුන් වැඩි වශයෙන් ම සිය කාලය ගත කිරීමට යොද ගන්නේත් ජලය ආශ්‍රිත ප්‍රදේශයි. උදහරණයක් ලෙස හිමෙන් අවාරණය නොවූ ලීඩ්ස් නමින් හඳුන්වන දිය කඩිති හෝ ඒ අවට ප්‍රදේශ, මුළු ශීත සෘතුව පුරාම හිම ඉවත්ව ගොසින් තිබෙන විශාල ජල තටාක ආශ්‍රිත ප්‍රදේශ දක්විය හැකි වෙයි.

කිසිදු නැවතිමකින් තොරව සැතපුම් 60 ක් (කිලෝමීටර් 96) දුර පීනා යැමට සමත් වන මොවුහු ඒ සඳහා සිය ඉදිරි පා යුගලෙන් වතුර තල්ලු කරමින් ඉදිරියට යාමටත් දුර්ලභ ගණයේ පසු පාද යුගලය සුක්කානමක් ලෙසත් යොද ගනිති.

වලස්සු අති දක්ෂ කිමිදුම්කරුවෝ ය. විනාඩි දෙකක පමණ කාලයක් පුරා දිය යට ගිලී සිටීමටත් මීටර් හතරාමාරක (අඩි 15 ක) ගැඹුරකට කිමිදීමටත් සූරයෝ වෙති. දිය යට සිටියදී ම නාස් පුඩු වසාගෙන දෙකන් පෙති පියාගෙන තමන්ගේ හිතට සරිලන ආකාරයේ ගොදුරක් ඇස ගැසෙන තෙක් දෑස් විවරව තබා ගැනීමටත් හිමවලස්සු සමත් වෙති.

පැයකට සැතපුම් හයක වේගයකින් එනම් පැයකට කිලෝමීටර් 10 ක වේගයකින් පිහිනා යාමේ හැකියාව හිම වලසුන් සතු වෙයි.

එපමණකුදු නොව හිම වලස්සු අති දක්ෂ කිමිදුම්කරුවෝ යි. විනාඩි දෙකක පමණ කාලයක් පුරා දිය යට ගිලී සිටීමටත් මීටර් හතරාමාරක (අඩි 15 ක) ගැඹුරකට කිමිදීමටත් ශූරයෝ වෙති. දිය යට සිටියදී ම නාස් පුඩු වසාගෙන දෙකන් පෙති පියාගෙන තමන්ගේ හිතට සරිලන ආකාරයේ ගොදුරක් ඇස ගැසෙන තෙක් දෑස් විවරව තබා ගැනීමටත් හිමවලස්සු සමත් වෙති.

පාවී යන හිම කැටියක් මත විවේක සුවයෙන් සිටින සීල් මත්ස්‍යයකු මවිත කරවන විලාසයෙන් දිය යට සිට එක්වරම අඩි හතක් හෝ අටක් පමණ උඩට පැනීමටත් හිමවලසකුට හැකියාව තිබෙන බව පර්යේෂකයන් විසින් සොයා ගෙන තිබේ.

## ප්‍රධාන ආහාර වේල සහ ආහාර සොයාගන්නා මූලාශ්‍ර

හිම වලසුන් අත්‍යන්තයෙන් ම මස් බුදින්නන් ය. මිදුණු හිම භූමියෙන් ඈත්ව ජලයේ රැඳී සිටින කාලය තුළ මොවුන්ගේ ප්‍රධාන ආහාරවේල සකස් වන්නේ බොහෝ විට මුහුදු ක්ෂීරපායී සතුන්ගේ මාංශයෙනි. උදහරණ ලෙස හොඳින් මෝරා වැඩුණු වටකුරු සීල් මත්ස්‍යයන් සහ ඇතැම් විට දළ තල්මස් පැටවුන් ආදීන්ගෙනි. සීල් මත්ස්‍ය ගහණය ඇති තරම් වෙත් නම් දින පහකට වතාවක් බැගින් උන් එකකු මරා ආහාරයට ගැනීමට හිමවලසුන් උනන්දු වෙයි. එසේ වුණත් සති ගණනක් යනතුරු වුව ද නිරාහාරව සිටීමේ හැකියාවක් ද මොවුනට තිබේ. ආහාර හිඟ කාලවලදී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අවශ්‍ය කරන තරමේ ආහාර තොගයක් ගබඩා කර තබා ගත හැකි පරිදි හිම වලසුන්ගේ ආමාශයන් හැඩ ගැසී තිබේ.

ග්‍රීෂ්ම සෘතුවේ හිම දිය වී යන විටදී සහ වැසි සමයන්හිදීත් හිම වලස්සු ආහාර සොයා ගැනීම සඳහා ගොඩබිමේ පිළිසරණ සොයා ඒ වෙත ඇදෙන්නට පටන් ගනිති.

සීමා සහිත ආහාර ප්‍රභවයන් ඇති මේ සමයෙහි මොවුහු සිය සිරුරේ බර ප්‍රමාණය අඩු මට්ටමක පවත්වා ගැනීමට වෑයම් කරති. ඒ සඳහා වෙරළ තීරයේ තිබෙන අතුණු බහනුත්, නුදුරින් පිහිටි ගොඩබිම ආශ්‍රිතව ඇති මලකුණු, කුරුලු බිත්තර, මීයන්, ලේනුන්, ධීවරයන් සහ ඉත්තෑවන් වැනි ලැටිගාත කුලයට අයත් සතුන් හා බෙරි වර්ග වැනි දේත් ඇතුලුව කෑමට ගත හැකි යයි සිතන ඕනෑම දෙයක් ආහාරය සඳහා ගනිති.

## වාසස්ථාන

සතෙක් සිය දිවියේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදුකරන එනම් ආහාර එක්රැස් කරගැනීම, විවේකය ගත කිරීම, සංවාසයේ යෙදීම, පැටවුන් බිහි කිරීම, ඔවුන් රැකබලා ගැනීම ආදී මෙකී නොකී සියල්ලක් ම කෙරෙන්නේ උනුනට වෙන් වූ වාස භූමි තුළයි.

විශාල ප්‍රදේශයක් පුරා මොවුන්ගේ වාසස්ථාන පැතිරී තිබේ. සීල් මත්ස්‍යයන් ගැවසෙන ඉමක් කොනක් බලා නිරන්තරයෙන් ම දුර බැහැර සංචාරයේ යෙදෙන්නට හිමවලසුන් රුසියෝ වෙති. හිම වලසෙක් සිය ජීවිත කාලය පුරාම වර්ග සැතපුම් 100 000 ක් ගමනෙහි යෙදෙන බව ගණන් බලා තිබේ.

හිම පතනයේ ස්වභාවය මත, සීල් මත්ස්‍ය ගහණයේ ප්‍රමාණය මත, හිම වලසුන්ගේ වාස භූමි අතිශය ක්‍රියාශීලී භාවයෙන් සහ විවිධත්වයකින් ද යුක්ත වෙයි.

හිම වලසුන් අතර ඉඩම් ආරවුල් කිසිත් නැත. මොවුන් ස්වකීය වාසස්ථානයන් අනෙක් වලසුන්ගෙන් ආරක්ෂා කිරීමට වෑයම් නොකරන අතර ම එකෙකුගේ වාසස්ථානයේ සීමා මායිම් නොතකා අනෙකාගේ වාසභූමියට ඇතුළු වීම නැතහොත් වාසස්ථාන මාරු කිරීම මොවුන්ට සිය දෛනික ජීවිතයේ සාමාන්‍ය සිදුවීමක් ද වෙයි.

## පැටවුන් බිහි කිරීම

සාමාන්‍යයෙන් ගැහැනු හිම වලසෙක් වයස අවුරුදු පහේ දී හෝ හයේ දී පමණ ලිංගික පරිණතියට පත් වන අතර පිරිමි වලසකුට හට ඒ සඳහා වසර අටක් පමණ ගත



වෙයි. මොවුනගේ සංවාසය සුනඛ පවුලේ සාමාජිකයන් ගේ ක්‍රියාද‍මයට සමාන ස්වරූපයක් ගනී.

මාර්තු මාසයේ අගත් ජූලි මාසයේ මැදත් අතර කාලය තුළ මිදුණු පාවෙන හිම කැටියක් මත මොවුන්ගේ සංවාසය සිදු වෙයි. ආසන්න වශයෙන් සති තුනක් පමණ වන සංවාස ප්‍රජනන කාලය තුළ එක් වලස් දෙනක් හිම වලසුන් ගණනාවක් සමග සංවාසයේ යෙදෙයි. පැටවුන් ඇති දැඩි කරන සමයේ දී ගැහැනු හිම වලසුන් නැවත නැවත ලිංගික ක්‍රියාවලියේ යෙදීම සිදු නොකරයි.

හිම වලසුන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය අපූර්ව වූවක්. එය 'ප්‍රමාදිත රෝපණය' යන නමින් හඳුන්වනවා. සංසේචනයට පත් වූ ඩිම්බය විවිධ කොටස්වලට බෙදී ගර්භාෂය තුළ මාස හයක පමණ කාලයක් පුරා එයට වැඩීම සඳහා අවශ්‍ය කරන පසුබිම සකස් වන තෙක් නිදහසේ පා වෙමින් තිබේ. සැප්තැම්බර් මාසයේ දිනයක සුදුසු වාතාරවණය සකස්ව තිබුණ හොත් කලල බීජයක් ගර්භාෂ බිත්තියේ තැන්පත් වී වැඩීම ආරම්භ කරයි. නව ජීවියෙක් අපේක්ෂාවෙන් සිටින මවකට මෙම ප්‍රමාදිත රෝපණ delayed implantation කාල පරිච්ඡේදය බෙහෙවින් ම වැදගත් වේ. ප්‍රසූතිය සඳහා උන්ගේ ලෙන් වෙත යාමට පෙර ගැහැනු හිමවලසෙක් මුළු ප්‍රසූත කාලය සඳහා ම අවශ්‍ය වන මේද ප්‍රමාණය රැස්කර තබා ගත යුතුවෙයි.

එසේ නොමැති වුවහොත් සංසේචිත ඩිම්බය ප්‍රමාදිත රෝපණ කාලය තුළදී නැවත වහාම මවගේ ශරීරයට උරා ගැනීමක් සිදු වෙයි. පැටවකු පිළිබඳ නව බලාපොරොත්තු සුන් කරගෙන යළිත් ශීත ඍතුවේ හිම මත ඇයට ඇගේ සුපුරුදු දඩයම් ජීවිතය අරඹන්නට සිදු වෙයි.

සංසේචිත ඩිම්බය ගර්භාෂය බිත්ති මත තැන්පත් වීමෙන් පසු ඔක්තෝබර් හෝ නොවැම්බර් යන මාස දෙක අතරතුරදී කුස තුළ පැටවා හොඳින් මෝරා වැඩෙයි. එම කාලය තුළ ගැබ සහිත මව සිය ලෙනට ඇතුල් වී විවේකීව කාලය ගත කරයි. එළඹෙන දෙසැම්බරයේ දී හෝ ජනවාරියේ දී ප්‍රසූතිය සිදුවන තෙක් මව සිටින්නේ එහියි.

සාමාන්‍යයෙන් එකේ සිට හතර දක්වා පැටවුන් සංඛ්‍යාවක් උපදින අතර පැටවුන් ඉපදීමේ සාමාන්‍යය ගත් කල එක් මවකට පැටවුන් දෙදෙනෙක් පමණ වන බව ගණන් බලා තිබෙනවා. උපදින මොහොතේ දී හිම වලස් පැටවුන් අන්ධ ය. දත් රහිත ය. ලොම් රහිත ය. ප්‍රමාණයෙන් ඉතා කුඩා ය. ආසන්න වශයෙන් පැටවකුගේ බර අවුන්ස 21 සිට 25 දක්වා වූ අගයන් ගනී. එම ප්‍රමාණය දළ වශයෙන් වයිරම් සහිත ලේනෙකුගේ බරට සමාන ය. එසේ වුවත් කිසිදු උපකාරයක් නොමැතිව නින්දේ සිටින තම මවගේ තන පුඩු සොයා ගොසින් කිරි උරා බීමට තරම් සමත්කමක් මොවුනට ඇත. වලස් මවගේ කිරි, වැඩි කැලරි ප්‍රමාණයකින් පොහොසත්ව තිබෙන අතර එහි 40% කට වැඩි මේද ප්‍රමාණයක් අඩංගු වෙයි. මව්කිරිවල පවා ඇත්තේ 4% ක මේද ප්‍රමාණයක් පමණයි.

සති කීපයක් ඇවෑමෙන් මව ලෙන තුළින් පිටතට එන කාලය වන විට එනම් මාර්තු මාසය අගදී හෝ අප්‍රේල් මාසය මුලදී හෝ ඉතා ඉහළ පෝෂණයකින් යුත් මවගේ කිරි ආහාරයට ගැනීමෙන් පසු මව අනුකරණය කරමින් පිටතට එන්නට හැකි තරම් වර්ධනයක් පැටවුන් තුළින් දැක ගත හැකි වෙයි. මේ අවස්ථාව වන විට එක් වලස් පැටවකුගේ බර කිලෝග්‍රෑම් 10 ත් 15 ත් (රාත්තල් 22 ක් සහ 33 ක් ) අතර පමණ වෙයි.

## ළදරු විය, යොවුන් විය සහ මරණය

හිම වලස් පැටවුන්ගේ ජීවත්වීම අතිශය තීරණාත්මක ය. බොහෝමයක් හිමවලස් පැටවු ඔවුන්ගේ ජීවිතයේ මුල්ම අවුරුදු කීපය තුළ මරණයට පත් වෙයි. කුසගින්න හෝ හාමත, ලෙඩ රෝග සහ හදිසි අනතුරු විසින් බොහෝ වලස් පැටවුන්ගේ ආයු කාලය සීමා වෙයි.

සාමාන්‍යයෙන් පළමු වසර දෙක හා දෙකහමාරක කාලය පැටවු සිය මව සමඟම ජීවත් වෙති. ඇතැම් විට මේ කාලයට තවත් අතිරේක වසරක් ද එක් වෙයි. පොදුවේ ගත් කල පැටවුන් සිය පළමු වසරින් පසුව එනම් ජූලි සැප්තැම්බර් මාස අතරතුර කිරි උරා බීම නවතා දමයි.

හිම වලස් පැටවුන්ගේ පැවැත් ම හෝ නැවැත්ම මුළුමනින් ම රඳා පවතින්නේ සිය මව මත ය. මව විසින් ඔවුන්ට රැකවරණය සලසන අන්දම, ආහාරය සඳහා ගන්නේ මොනවා ද? ඒවා තිබෙන්නේ කොහේ ද? ඒවා ලබා ගන්නේ කෙලෙසක ද? ගැහැනු සතුන් හා ආශ්‍රය පවත්වා ගන්නේ කෙබඳු ආකාරයකට ද? හිම මත දී සිදුවන භයානක උවදුරුවලට විරුද්ධව සටන් කරන්නේ කෙසේ ද? යන මෙකී සියලු කාර්යක් ම පැටවා ඉගෙන ගන්නේ සිය මවගෙනි.

යොවුන් වියේ පසුවන වලසුන් පවා සිටින්නේ අතිශය ජීවිත අවදානමක ය. සාමාන්‍යයෙන් මව නැවත වරක් ගැබ් ගෙන ප්‍රසූතිය සඳහා ලෙන තුළට යන කාලය එළඹී කල මව විසින් ඔවුන්ව පළවා හරිනු ලබයි. ළඟ එන ශීත කාලය පුරාමත්, හිම නොමැති කාලය ගත කිරීම සඳහාත් සිය ජීවිතය නොනසා පවත්වා ගැනීමට අවශ්‍ය කරන ආහාර ප්‍රමාණය තමන් විසින් ම

හිම වලස් පැටවුන්ගේ ජීවත්වීම අතිශය තීරණාත්මක ය. බොහෝමයක් හිමවලස් පැටවු ඔවුන්ගේ ජීවිතයේ මුල්ම අවුරුදු කීපය තුළ මරණයට පත් වෙයි. කුසගින්න හෝ හාමත, ලෙඩ රෝග සහ හදිසි අනතුරු විසින් බොහෝ වලස් පැටවුන්ගේ ආයු කාලය සීමා වෙයි.

සපයාගෙන මේද රක්ෂිතයන් වර්ධනය කර ගැනීමට තනිවම ජීවන සටනට උරදීම සඳහා ඉක්මනින් ම පුරුදු පුහුණු වීමට නව යෝනත් හට සිදු වේ.

තම මව විසින් එළවා දැමූ පසු එකම මවගෙන් බිහි වූ සහෝදර සහෝදරියන් සමග එකට කණ්ඩායමක් සේ කාලයක් ජීවත් වීම මොවුන්ගේ ආරක්ෂාවට හා පැවැත්මට තරමක් දුරට හෝ හේතු වෙයි.

## හේමන්ත නිද්‍රාව

කාලයේ ඉම් කොත් නොතකා හේමන්ත නිද්‍රාව ලබා ගැනීම සඳහා ශීත කාලයේ දී බිලකට ඇතුල් විය හැකි එකම වාසනාවන්ත හිම වලසා වන්නේ ගැබ්බර හිම වලස් මව පමණකි. ඇතැම් අවස්ථාවන්වලදී අනෙක් හිම වලසුන් ශීත කාලයේ හමන දැඩි ශීත කුණාටු වලින් ආරක්ෂා වීමටත් ග්‍රීස්ම ඍතුවේදී ඇති වන තද රස්නයෙන් සහ කෘමි සතුන්ගේ කරදරයෙන් මිදී සිටීමටත් තාවකාලික මුවාවන්, රැකවල් ස්ථානයන් තනා ගනියි.

අනෙක් හිම වලසුන්ට වඩා ගැබ්බර හිම වලසුන් විවේකයෙන් පසුවන කාලය පුරාම අවශ්‍ය කරන රක්ෂිත මේද ප්‍රමාණය හැකි පමණ වර්ධනය කරගන්නා අතර එමගින් ඇගේ කලලයේ විකසනයට උවමනා කරන ආහාර ප්‍රමාණය සැපයීමත්, ප්‍රසූතියෙන් පසු ලෙන අතැර නැවත සුපුරුදු දිවියට එන තෙක් පැටවුන් පෝෂණය කිරීම සඳහාත් ඒවා ප්‍රයෝජනයට ගැනීම සිදු කරයි.

ගැබ්බර හිම වලසුන් තම ප්‍රසූතිය සඳහා අවශ්‍ය වන තිඹිරිගෙය තමාම සකසා ගනී. එය වෙරළ තීරයට මඳක් නුදුරින් උතුරට මුහුණලා ඇතුළට ලිස්සා යාමට පහසු බෑවුමක් සහිතව සැදූවකි.

මෙම ප්‍රසූතිකාගාරය බිත්තරයක හැඩය ගනී. එහි ගැඹුර අඩි හයහමාරත් දහයත් අතර වූ ඇතුළු වීම සඳහා දිගු විවරයක් සහිතව සැදූ කුටියකි. මවගෙන් ගෙනෙන උණුසුමත් හිමයෙහි තිබෙන ගති ස්වභාවයත් මතත් දැඩි ශීතල පරයා තිඹිරිගෙය අලුත් පැටවුන්ට උවමනා උණුසුමෙන් සමන්විතව තිබේ.

හේමන්ත නිද්‍රාව අතරතුර හිම වලසකුගේ හෘද ස්පන්දනය මිනිත්තුවකට හතලිස් වාරයක හෝ හැත්තෑ වාරයක පමණ සිට මිනිත්තුවකට අටේ සිට දෙළහ දක්වා වන වේගයකට පහත වැටේ. ධාතු වෙනස්වීම හරි අඩකින් ද පහත බසියි. වෙනත් සතුන් විවේකීව සිටින කාලයේ දී මෙන් නොව හිම වලසුන් හේමන්ත නිද්‍රාවෙන් පසුවන කාලයේ දී උන්ගේ ශරීර උෂ්ණත්වය සෙල්සියස් අංශක තුනේ සිට හත දක්වා එනම් පැරන්හයිඩ් අංශක නම් පහේ සිට නවය දක්වා අඩුවීමක් සිදු වේ.

නිද්‍රාවේ නිමග්න වී සිටින කාලය තුළදී හිම වලසුන් මුත්‍රා කිරීම හෝ මලපහ කිරීම සිදු නොකරයි. වෙනත් සතකු හට නම් මෙලෙස මුත්‍රා බැහැර නොකර සිටීමෙන් එක් වන යූරියා ප්‍රමාණය සතියක් තුළ මරණය කැඳවීමටත් සමත් වෙයි.

එසේ වුවත් ගැබ්බර හිමවලසුන්ගේ ශරීරය තුළ සිදුවන අද්විතීය ක්‍රියාදමයක් තුළින් එම යූරියා ප්‍රමාණය ප්‍රයෝජනවත් ප්‍රෝටීන බවට පත් කරයි.

සෑම ගැබ්බර හිම වලසෙක් ම මෙමකාලය තුළ දී උන් ගේ බරින් සැලකිය යුතු ප්‍රමාණයක් වැය කරයි. අලුත පැටවුන් බිහි කළ හිමවලස් මව්වරුන් හට නම් පැටවුන් වෙනුවෙන් සිය ශක්තියෙන් 40% ක් පමණ වැය කිරීම අපහසු කටයුත්තක් නොවේ.

ප්‍රසූතිකාගාරයක් ලෙස තනා ගත් සිය ලෙන තුළ රැඳී සිටින මුල් කාලය තුළ ගැහැනු හිම වලසුන් අලස, උදාසීන ස්වභාවයකින් පසුවන නමුත් නැවත කෙටි කාලයකට පසු හිම මතට පිවිසෙන ඇය ඇට ම විශේෂ වූ සුපුරුදු ක්‍රියාශීලී දඩයම් දිවිය අරඹයි.

වලස් විශේෂ අතුරින් විශාල ශරීරයකට හිමිකම් කියන, ක්ෂීරපායි සත්ත්වයකු වන ධ්‍රැව වාසියා හට දියුණු මනසක් හිමි ක්ෂීරපායි සත්වයකු වන මිනිසාගෙන් සැලසෙන සෙත ප්‍රමාණවත් ද?

එය උදාවන හැම දිනයකම වන් සත්ත්ව ජීවිත මෙන් ම මුළු පරිසරයම මුවින් නොබැන අපේ හදවත්වලට තට්ටු කරමින් විමසන එකම පැනය වනු ඇත.